**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ සහකාර -තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022**

1.0 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන වලට අනුකූලව, I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2022 අප්‍රේල් මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන අතර එම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරනු ලබන නීතිරීති වලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

3.0 විභාගය සඳහා වන අයදුම්පත්‍රය

a. මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතුය.
b. ආදර්ශ අයදුම්පත්‍රයේ දක්වා ඇති පරිදි අංක 01 සිට 06 දක්වා කොටස පළමු පිටුවට ද, ඉතිරි කොටස දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි A-4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කර යතුරු ලියනය හෝ පරිගණකය භාවිතයෙන් හෝ සකස් කරගත යුතුය.
c. විභාග අයදුම්පත ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු අතර අත්සන සහතික කරන නිලධාරියාගේ නිල මුද්‍රාව තැබිය යුතුය.
d. සියළුම අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තිබිය යුතුය.
e. අදාළ අයදුම්පත් සහිත ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ස.සං.නිලධාරින් සඳහා I වන කාර්යක්ෂතා කඩඉම් විභාගය ලෙස සඳහන් කළ යුතුය.
f. අදාළ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්,අයදුම්කරුවන් විසින් තම ආයතන ප්‍රධානියා මඟින් **<u>2022.03.24</u>** දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 4 වන මහල, සෙත්සිරිපාය 1 අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
g. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
h. විභාගයට ඉල්ලුම් කරන දින වන විට අදාළ අයදුම්කරුගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියළු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සළකනු නොලැබේ.

4.0 අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කිරීම

අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී හා විභාග මධ්‍යස්ථාන වලට ඇතුළු වීමේදී පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් ඉදිරිපත් කර තම අනන්‍යතාව සහතික කළ යුතුය. මෙම අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබා නොදීමට විභාග ශාලාධිපතිවරයාට බලය ඇත.

a. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
b. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
c. වලංගු රියදුරු බලපත්‍රය.

5.0 විභාග ප්‍රවේශ පත්‍රය:

a. අදාළ නිවේදනයේ සඳහන් උපදෙස් පරිදි සකස් කර නියමිත දින හෝ එදිනට පෙර එවන ලද අයදුම්පත් වල සඳහන් තොරතුරු නිවැරදි බවට වන පූර්ව නිගමනය මත එකී අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.
b. විභාග ප්‍රවේශපත් නිකුත් කළ වහාම දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙහි ඒ පිළිබඳ නිවේදනයක් පළකරනු ලැබේ.
c. විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 3කට වත් පෙර තම විභාග ප්‍රවේශ පත්‍ර නොලද අයදුම්කරුවන් විසින් ඒ බව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙ පාලන අංශයෙන් විමසා බැලිය යුතු අතර එහිදී තම විභාග අයදුම්පත්‍රය ලියා පදිංචි කර එවන ලද රිසිට්පත ඉදිරිපත් කළ යුතුය.
d. අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහුට/ඇයට විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවේ.
e. විභාග ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.
f. මෙම විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබී ඇති නිලධාරීන් සඳහා විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි ආයතන ප්‍රධාන විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය.
g. මෙම විභාගයට සහභාගීවීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.
h. විභාග ප්‍රවේශ පත්‍රයෙහි තැබිය යුතු අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු ඉදිරියේ තැබිය යුතු අතර එම නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව තැබිය යුතුය.

6.0 විභාගයේ භාෂා මාධ්‍යය:

මෙම විභාගය සිංහල හා දෙමළ භාෂා වලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවන් තමා විසින් තමා විභාගයට පෙනී සිටීමට කැමති භාෂා අදාළ අයදුම්පතෙහි නිවැරදිව සටහන් කළ යුතුය. අයදුම්පතෙහි සඳහන් භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.0 විභාගය පිළිබඳ විස්තර :

අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.

7.1.a. පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| විෂය අංකය | විෂය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා කාර්යාලීය ක්‍රම | පැය 03 | 100 | 40% |
| 02 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු පනත හා ජීවනෝපාය සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති | පැය 03 | 100 | 40% |

7.1.b. පළමු වන (01) කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්යාලීය ක්‍රම | රජයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාවද, රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිළි හා සංක්ෂිප්ත සටහනක් මගින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝග අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.<br>2009.02.20 දිනැති අංක 1589/30 දරණ කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහයේ VII, XII, XIV, XXIV පරිච්ඡේද පිළිබඳ දැනුම |
| මුදල් රෙගුලාසි | රජයේ කාර්යාල වල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යය පිළිබඳ අවබෝධය හා දැනුම මැන බැලීම අපේක්ෂා කෙරේ.<br>මුදල් රෙගුලාසි අංක 119, 124 සිට 128, 133 සිට 134, 154 සිට 156, 168, 177 සිට 178, 343 |
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු පනත හා ජීවනෝපාය සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ පනතේ විධිවිධාන, ප්‍රජාමූල බැංකු, ග්‍රාමීය සංවර්ධනය සඳහා දායකත්වය, ග්‍රාමීය සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතන වල දායකත්වය |

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව